**වවුනියාව මහානගර සභාව - (2023/03/19 -2023/12/31)**

**-----------------------------------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වවුනියාව මහානගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වවුනියාව මහානගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහානගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහානගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහානගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහානගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහානගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා රු. 23,868,064 ක් වූ ක්‍රියාකාරකම් 19ක් ඉටුකර නොතිබූ නමුත්, ඇස්තමේන්තු, | ණයහිමි ප්‍රතිපාදන වෙනුවෙන් ගෙවීම් වවුචර් සකස් කර අදාල කර්මාන්තවල වටිනාකම්, වියදම් ලෙස මූල්‍ය වර්ෂය අවසානයේ | තථ්‍ය බැරකම් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුම් සහ තීරණ මත පදනම්ව ගෙවීම් වවුචර් සකස්කර විවිධ ණයහිමි යටතේ ගිණුම්ගත කිරිමෙන් ජංගම බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අදාල මූලධන වියදම්වල හර කර විවිධ ණයහිමි ගිණුමට වෙන්කිරිම්/සංචිත ලෙස මාරුකර තිබූ බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් මාර්ග 19 කට බොරළු දැමීමෙන් සිදුවූ නඩත්තු වියදම් රු. 9,586,114 ක් මූලධන වියදම් ලෙස ගිණුම්ගත කිරිමෙන් මූලධන වියදම් මෙම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මාර්ග 19 කට බොරළු දැමීමේ වියදම් රු. 5,478,930 ක් මූලධන වියදම් ලෙස ගිණුම්ගත කර ඇති බව. | සුදුසු වියදම් කාණ්ඩය තුළ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ යන්ත්‍රෝපකරණ 27ක වටිනාකම රු. 5,478,930 ක් ලීබඩු කාණ්ඩයේ වටිනාකම තුළ ඇතුළත් කිරිමෙන් මෙම වටිනාකමින් ලීබඩු කාණ්ඩයේ වටිනාකම වැඩියෙන් සහ පිරියත යන්ත්‍රෝපකරණවල වටිනාකම අඩුවෙන්ද දක්වා තිබුණි. | කාර්යාල උපකරණ, පරිගනක ආදිය ලීබඩු සහ කාර්යාල උපකරණ කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබූ අතර එයට අනුකූලව ගිණුම්ගත කර තිබුණු බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් පැරණි බස් නැවතුම්පොලෙහි පිහිටි මගී රැඳීසිටීමේ ගොඩනැගිලි සංකීර්ණය ඉවත් කර තිබූ අතර මෙහි වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් වටිනාකමෙන් ඉවත් කර නොතිබුණි. | අදාල ඉවත් කළ ගොඩනැගිල්ලෙහි වටිනාකම තක්සේරු කළයුතුව පැවැති බැවින් 2024 වර්ෂය දක්වා වූ ස්ථාවර වත්කම් වටිනාකමින් ඉවත් කර නොතිබුණු බව. | වත්කම් වටිනාකම නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නියමිත කාලයට අදාල වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකළ යුතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ඉඩම් 16කට අදාල හිමිකම් ඔප්පු සහ පත්ඉරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මහානගර සභාවට අයත් හෙක්ටයාර 16.17ක් වූ ඉඩම් 26කට අදාල පවරා ගැනීමේ නියෝග ලබාගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බව. | විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වත්කම් සහ වගකීම්වල ශේෂ එකතුව රු. 1,642,862,542 ක් සත්‍යාපනය කිරිමට ප්‍රධාන ලෙජරය සහ ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී බහුතර වශයෙන් වූ ක්‍රියාවලීන් පරිගණනක ගත කර ඇති බැවින්, ප්‍රධාන ප්‍රධාන ලෙජරයේ ඇතුළත් කාරණා පරිගණකය හරහා සිදු කෙරුණු බව. | -එම- |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් ශීර්ෂ 03ක් යටතේ හඳුනාගෙන තිබූ හිඟහිටි එකතුව රු. 39,881,237ක් විගණනයේදී තහවුරු කිරිමට පෞද්ගලික හිඟහිටි ලැයිස්තු, හිඟහිටි කාල විශ්ලේෂණය, හිඟහිටි ලේඛනය ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන කෙටි කාලයක් තුළ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් එම සනාථ කිරීම් ඉදිරිපත් නොකළ බව. | -එම- |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) | | | | |
| | (i) 155 වගන්තිය | - | සභාවට අයත් කඩකාමර 304 ක කඩකාමර කුලී ගාස්තු සහ ඉඩම් 95ක් සඳහා ඉඩම් බදු ගාස්තු කාලීනව තක්සේරු කර අය කිරිමට පියවර ගෙන නොතිබුණි. | කඩකාමර 255 ක් සඳහා 2024 වර්ෂයේ තක්සේරු කිරීම් සිදුකර නව තක්සේරු මිලගණන් මත කුලී අයකර තිබුණු බව. | පනතේ විධි විධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) 252 වගන්තිය | 34,082,765 | වරිපනම් බදු නොගෙවන දේපළ හිමියන්ට එරෙහිව ලිඛිත දැනුම්දීම් සිදුකර අයකළ යුතු මුදල් අයකර ගැනීමට හෝ දේපළ තහනම් කර සිදුකළ යුතු ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට වූ ගිණුම්වල දක්වා ඇති හිඟහිටි එකතුව රු.32,707,191කින් මේ දක්වා රු.8,244,934ක් අයකර තිබූ බව. | -එම- |
| (ආ) | 1971 අංක 48 දරන පළාත් පාලන | - | වරිපනම් බදු අය කිරීම සඳහා මහානගර සභා බල | 2024 වර්ෂයේ අවසාන | අදාළ විධිවිධානවලට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආයතනවලට අදාල විශේෂ විධිවිධාන | | ප්‍රදේශය තුළ පිහිටි නිශ්චල දේපළ සෑම වර්ෂ 5 කට වරක් තක්සේරු කළයුතු වුවත් 2009 වර්ෂයේදී තක්සේරු කළ දේපළ ඒකක සංඛ්‍යාව 15,340 මත පදනම්ව වරිපනම් බදු අය කර තිබුණි. | කාලපරිච්ඡේදයේ තක්සේරු කටයුතු අවසන් වූ බැවින්, 2025 වර්ෂයේ සිට නව දේපල තක්සේරු මිලගණන් මත පදනම්ව නව වටිනාකමට වරිපනම් බදු අය කරනු ලබන බව. | අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | මහානගර සභාව සතු වාහනවල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | මහානගර සභාවේ ලාංඡනය ප්‍රදර්ශනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |
| (ඈ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ 02(අ) වගන්තිය | - | වර්ෂ 05 සිට වර්ෂ 10 කට අධික කාලයක සිට අභාවිතව පැවැති හා මාර්ගයේ ධාවනයට නුසුදුසු වාහන 10 ක් ඉවත් කිරීමට මහානගර සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ නැවතත් වෙන්දේසියේ විකිණීමට සහ අමතර කොටස් ලෙස විකිණීමට අදාලව තක්සේරු කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 59,851,921 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු සකස් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 24,462,256ක හිඟහිටි වරිපනම් බදු ශේෂය වර්ෂ 02 සිට 10ක් අතර කාල පරාසයක සිට පැවැතුණි. | 2024 දෙසැම්බර් 31 දිනට වූ අවසන් ගිණුම්වල දක්වා ඇති හිඟහිටි එකතුව රු.32,707,191 කින් මේ දක්වා රු.8,244,935 ක් අයකර තිබූ බව. | දීර්ඝකාලීන හිඟහිටි ආදායම් අයකර ගත යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සභාව සතු දේපළවලින් ලැබිය යුතු හිඟහිටි බදු ආදායම රු. 733,217ක් පසුගිය වර්ෂ 02 සිට 10ක් දක්වා කාලයක් අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | හිඟමුදල් රු. 733,217.00ක් අයකර ගැනීමට සමථ මණ්ඩල කටයුතු සිදුකෙරෙමින් සිටින බව. | -එම- |
| (ii) | සභාව සතු කඩ කාමර 304 ක් සහ ඉඩම් 95 ක් සඳහා ඉඩම් බදු ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ 01 සිට 33 දක්වා කාලයක් ඉකුත්වී තිබූ නමුත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක 1980/46 දරන චක්‍රලේඛයේ 7 ඡේදයට අනුකූලව නැවත ගිවිසුමක් සඳහා එළැඹීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර 336 ක් සහ ඉඩම් 95ක් ඇතුළු සම්පූර්ණ කුලී හිමියන් 431 දෙනෙකු සඳහා විවිධ වූ දිනයන්වලදී ගිවිසුම්වලට එළැඹ තිබීම හේතුවෙන්, ගිවිසුම් දිනයන් එකම දිනයකට වෙනස් කිරීමට 170 දෙනෙකු විසින් නම වෙනස් කර ගිවිසුම් අළුත්කිරීමට ඉල්ලීම්ද ලැබී ඇති බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | | |
| (i) | මහා නගර සභා ආඥා පනතේ 247(අ) වගන්තියට ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර සම්බන්ධයෙන් නිසි සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර, වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයවැයට ඇතුළත් කර ඇති අතර, එවැනි බලපත්‍ර නොමැතිව ක්‍රියාත්මක වන ව්‍යාපාර ආයතනවලට එරෙහිව නගර සභා ආඥා පනතේ 247(6)4 වගන්තියට අනුව නීතිමය පියවර ගෙන නොතිබුණි. | 2026 වර්ෂ කාල පරිච්ඡේදයේ සිට, මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කර, වෙළෙඳ බලපත්‍ර ලබා නොගෙන ක්‍රියාත්මක වන අයට එරෙහිව නඩු පැවරීම් පියවර ගැනීමට නියමිත බව | පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | මහා නගර සභා ආඥා පනතේ 267 වගන්තියට ප්‍රකාරව, දැන්වීම් පුවරුවලට අදාළ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර, විගණනයට ඉදිරිපත් කර තිබූ ලැයිස්තු ප්‍රකාරව, අතිරේක දැන්වීම් පුවරු බලපත්‍ර ගාස්තුව ලෙස රු. 1,735,100 ක් ගණනය කර තිබූ නමුත්, එය අයකිරීමට හෝ ගිණුම්වල දැක්වීමට හෝ පියවර ගෙන නොතිබුණි. | 2026 වර්ෂය වන විට වෙළඳ දැන්වීම් ගාස්තු සම්පූර්ණයෙන් අයකිරීමට අපේක්ෂා කර ඇති අතර, එලෙස නොගෙවූ වෙළඳ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් මහානගර සභා ආඥාපනතට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | මහානගර සභා බල ප්‍රදේශය තුළ වර්ෂ 01 සිට10 කට පෙර පාරිසරික බලපත්‍ර ලබා ගත් ව්‍යාපාරික ආයතන 33කින් වර්තමානයේ බලපත්‍රයක් අවශ්‍ය ව්‍යාපාරික ආයතන හඳුනා ගැනීම සඳහා විධිමත් සමීක්ෂණයක් සිදුකර නොමැති බැවින්, මහානගර සභා බල ප්‍රදේශය තුළ කොපමණ ව්‍යාපාර සඳහා පරිසර බලපත්‍රයක් අවශ්‍ය දැයි සනාථ කර ගත නොහැකිව පැවතුණි. | වර්තමානයේ, පාරිසරික බලපත්‍ර ලබාගත යුතු අවශ්‍යතා පවතින ව්‍යාපාරික ආයතන හඳුනාගෙන වර්ගීකරණය කර ඇති අතර, වර්ෂ 03 කට වරක් පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර සඳහා ලිපි යැවීම සිදුකරමින් පවතින බව. | විධිමත් සමීක්ෂණයක් සිදුකර පාරිසරික බලපත්‍ර නිකුත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහානගර සභාවක් ලෙස නැවත ස්ථාපනය කළ 2023 මාර්තු 18 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා සභාව විසින් අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | නගර සභාවට අදාල අයවැයට අනුකූල වන පරිදි සියළුම ක්‍රියාකාරකම් 2023 වර්ෂය තුළ සිදු කර තිබුණු බව. | අදාල කාලපරිච්ඡේදයට අදාලව මහානගර සභාව සඳහා අයවැය සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ, උපයාගත් ආදායමෙන් රු.3,000,000 ක් සභාවේ තීරණ සහ කළමනාකරණ කමිටු රැස්වීමේ තීරණයකින් තොරව සංවර්ධන සංචිතයට මාරු කර තිබුණි. | සභාවේ 2024 පෙබරවාරි 21 දිනැති අංක 17 දරන කළමනාකරණ කමිටු රැස්වීමේ තීරණ අනුව, 2023 වර්ෂය සඳහා ආදායම් අතිරික්තය වන රු. මිලියන 30 ක් සංවර්ධන සංචිත ගිණුමට මාරු කරන බවට තීරණය කර තිබූ බව. | අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | නගර සභාවට අයත් පර්චස් 7 ක ඉඩමක් පුද්ගලයෙකු අත්තනෝමතික ලෙස අත්පත් කරගෙන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන නමුත්, නගර සභා ආඥා පනතේ 255 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම, ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම්වරයා මාර්ගයෙන් මායිම් සලකුණු කිරීම අවසන් වූ පසු, අදාළ ඉඩම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | පනතේ විධිවිධාන අනුව පියවර ගත යුතුය. |
| (ඈ) | මහානගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලිවලින් වරිපනම් බදු අය කිරීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර නිකුත් කළ යුතු බව සඳහන් වුවද, සමාලෝචිත වර්ෂය තුළ, සභාව විසින් වරිපනම් බදු අය කරනු ලබන දේපළ 11,372 කින්, දේපල 397 කට K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | ආකෘති පත්‍රවල නම් හා දැනට පදිංචි පුද්ගලයන්ගේ නම් අතර වෙනසක් පවතින බැවින්, ඒවා බෙදාහැර නොමැති බව. | සියලුම වරිපනම් දේපළ සඳහා K ආකෘති පත්‍ර බෙදා හැරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් 2018 වර්ෂයේ රු. 7,230,939 ක් වැය කර ඉදිකළ වවුනියාකුලම් සංචාරක මධ්‍යස්ථානය පුද්ගලයෙකුට බදුදී තිබූ නමුත් එම බදුකරු විසින් එය වර්ෂ 04 කට අධික කාලයක් මහජනතාව වෙනුවෙන් විවෘත නොකර පැවතුණි. එසේම, බදු කුලී තැන්පතු මුදල් ඇතුළුව රු.277,000 ක් පමණක් එම බදුකරුගෙන් ආදායම් ලෙස මේ දක්වා සභාව විසින් අයකර තිබුණි. | බදුකරු ගිවිසුම උල්ලංඝනය කර සභාවේ අනුමැතිය ලබා නොගෙන අමතර ඉදිකිරීම් සිදුකර ඇති බැවින් නගර සභාව බදුකරුට එරෙහිව දිසා අධිකරණයේ වර්තමානයේ නඩුවක් විභාග වෙමින් පවතී. මේ නිසා මෙම බදු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගත නොහැකිව පවතින බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීම පිළිබඳව ඉදිරි සභා රැස්වීම්වලදී සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | සුදුසු නීති සම්පාදනය කළ යුතුය. |
| (උ) | මහානගර සභාවල ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා සභාව විසින් දිගුකාලීන සැලැස්මක් සකස් කර නොතිබුණි. | සන අපද්‍රව්‍ය බැහැර කරන පම්බයිමඩු සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය වවුනියාව දෙමළ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමකි. මෙම ස්ථානය සම්බන්ධයෙන් ප්‍රජා මට්ටමින් අඛණ්ඩව පැමිණිලි ලැබී ඇති බැවින් මෙම ස්ථානය වෙනස් කළ යුතු තත්ත්වයක් පවතී. එබැවින්, මෙවැනි ස්ථානයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව. | සුදුසු ස්ථානයක් තෝරාගෙන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිස් ඉඩම් බදුදීම සඳහා වූ බදු ගිවිසුමේ 04 වන වගන්තියට ප්‍රකාරව, සභාවේ පූර්ව අවසරයකින් තොරව බදු ලබාගෙන ඇති එම ඉඩම්වල නාගරික සංවර්ධන අධිකාරී ආඥාපනතට පටහැනිව, බදුකරුට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකිව තිබුණි. කෙසේ වෙතත්, එම ගිවිසුමට පටහැනිව බදු දී ඇති ඉඩම් 95 ක බදු ලබාගෙන ඇති අය විසින් ස්ථිර ගොඩනැගිලි ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන්, මහානගර සභා ආඥාපනතේ 42A වගන්තියට අනුව මහානගර සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. | 2025 අගෝස්තු 29 දිනැති අංක VMC/2025/09/03/32 දරන මහානගර සභා රැස්වීම් තීරණ අනුව, මහානගර සභාව විසින් ලබා දී තිබූ දේපළ 95 කින් අවසරයකින් තොරව ඉදිකරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් කමිටුවක් ස්ථාපිත කර ඒ මාර්ගයෙන් පියවර ගනිමින් පවතින බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබූ අතර, මහජනතාවගේ පැමිණිලි මත පදනම්ව පමණක් අනවසර ව්‍යුහයන් හඳුනාගෙන තිබුණි. එසේම, අනවසර ඉදිකිරීම් පිළිබඳ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන නොතිබුණි. | ඉදිරි කාලයේ මහානගර සභාව ක්ෂේත්‍ර නිලධාරීන්, කොට්ඨාශ මට්ටමින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර අනවසර ඉදිකිරීම් පිළිබඳ තොරතුරු රැස්කර නාගරික සංවර්ධන පනත යටතේ ක්‍රියමාර්ග ගැනීමට නියමිත බව . | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නියමිත ලේඛන පවත්වාගෙන යා යුතු අතර ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ලබාදුන් සංවර්ධන බලපත්‍ර 58 ක් සඳහා අනුකූලතා සහතික ලබා දී නොතිබුණි. | අනුකූලතා සහතික ලබාගන්නා ලෙස දැනුම් දීමේ ලිපි යවමින් පවතී. නියමිත කාල සීමාව අවසන් වූ පසුව අනුකූලතා සහතික ලබානොගත් අයට එරෙහිව නඩු පැවරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | සුදුසු පරිදි අනුකූලතා සහතික ලබා දිය යුතුය. |
| (ඈ) | මහානගර සභා බලප්‍රදේශ සීමාව තුළ ලියාපදිංචි කර ක්‍රියාත්මකව නොපවතින ප්‍රජා පාදක මධ්‍යස්ථාන 02ක් ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | ප්‍රජා පාදක මධ්‍යස්ථානවල රැස්වීම් පැවැත්වීමේ ඉදිරි ක්‍රියාමාර්ග ප්‍රජා පාදක සංවර්ධන නිලධාරීයා විසින් සිදුකරමින් පවතින බව. | ප්‍රජා පාදක මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින ට්‍රැක්ටර් 02ක්, ට්‍රේලර් 11ක්, ටිපර් රථ 03ක්, ගලි බවුසර් 04ක්, බැකෝ ලෝඩරයක් සහ රෝද දෙකේ ට්‍රැක්ටරයක් ආදිය අළුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල වාහන ධාවනයේ යෙදවීම සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වත්කම් උපයෝජනය කර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

# 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු කිරීම් සකස් කර නොතිබුණි. මේ හේතුවෙන්, අදාල කාල පරිච්ඡේදය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ ආදායම් සහ වියදම් විචලනයන් සැසඳීමට හැකියාවක් නොතිබුණි. | කොමසාරිස්වරයා පත්කිරීම සහ සභිකයින් තෝරා පත්කිරීම වැනි මූලික අවශ්‍යතා කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් මහානගර සභාවට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ හැකියාව 2023 වර්ෂයේ නොපැවැති හෙයින් නගර සභාවට අදාල වන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. නගර සභාවට අදාල අයවැය මත පදනම්ව සියළුම ක්‍රියාකාරකම් 2023 කාල පරිච්ඡේදයේ සිදුවී තිබුණු බව. | අදාල කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතුය. |